# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2032/12 – 2017 අගෝස්තු 16 වැනි බදාදා – 2017.08.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත 1 ඡේදයේ විස්තර කරනු ලබන ඉඩම්වල පරවශ්‍යතාව, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි. එකී පරවශ්‍යතාව අත්කර ගනු ලබන්නේ කවර ඉඩමකින්ද යන්න 2 ඡේදයේ විස්තර වේ.

1. **පරවශ්‍යතාවේ විස්තරය.**– මොණරාගල-බුත්තල ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ කුඹුක්කන තුළුමුව ඉඩමට ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් කොටස්වල පරවශ්‍යතා අයිතිය අත්කර ගැනීම.

2. **ඉඩමේ විස්තරය.**– ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බුත්තල වැදිරට කෝරලේ සුළු කොට්ඨාසයේ, ඔක්කම්පිටිය ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එම්ඕ/බීටීටී/2015/725 හා 2016.06.24 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර ඒ, බී හා සී ලෙස සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.1220 ක් පමණ වන ඉඩම් කොටස් 03 ට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – ඇලමානය – ප්‍රමාණය: හෙක්. 0.0619 ක් පමණ**
උතුරට: ඊ. ඒ. අනුලාවතී හිමිකම් කියන ඇලමානය; නැගෙනහිරට: ඊ. ඒ. අනුලාවතී හිමිකම් කියන ඇලමානය සහ ඇළ; දකුණට: ඇළ, ඊ. ඒ. අනුලාවතී හිමිකම් කියන ඇලමානය සහ කුඹුක්කන් ඔය; බටහිරට: ඊ. ඒ. අනුලාවතී හිමිකම් කියන ඇලමානය සහ කුඹුක්කන් ඔය.

02. **කැබලි අක්ෂර 'බී' – ඇලමානය – ප්‍රමාණය: හෙක්. 0.0495 ක් පමණ**
උතුරට: ඇළ, ඊ. ඒ. අනුලාවතී හිමිකම් කියන ඇලමානය; නැගෙනහිරට: ඊ. ඒ. අනුලාවතී හිමිකම් කියන ඇලමානය සහ මාර්ගය; දකුණට: මාර්ගය සහ ඊ. ඒ. අනුලාවතී හිමිකම් කියන ඇලමානය; බටහිරට: ඊ. ඒ. අනුලාවතී හිමිකම් කියන ඇලමානය සහ ඇළ.

03. **කැබලි අක්ෂර 'සී' – ඇලමානය – ප්‍රමාණය: හෙක්. 0.0106 ක් පමණ**
උතුරට: ඇළ සහ අයිතිකරු සොයාගත නොහැකි ඇලමානය; නැගෙනහිරට: අයිතිකරු සොයාගත නොහැකි ඇලමානය සහ මාර්ග (මා.සං.අ); දකුණට: මාර්ග (මා.සං.අ) සහ අයිතිකරු සොයාගත නොහැකි ඇලමානය; බටහිරට: අයිතිකරු සොයාගත නොහැකි ඇලමානය සහ ඇළ.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4/3/9/2015/ඩබ්එස්/98.
2017 ජූනි මස 21 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08-1042